# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2025.07.15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2025 ජූනි

**2025 ජූනි මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි.**

**නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2025 ජූනි මාසයේ දී දර්ශකාංක 51.9ක් වාර්තා කළේය.** සේවා නියුක්තිය හැර අනෙකුත් සියලුම උප දර්ශක මාසය තුළ දී කඩඉම් මට්ටමට වඩා ඉහළින් පැවතුණි.


ජූනි මාසයේදී නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශක තවදුරටත් වර්ධනය විය. තවද, මාසය තුළ දී නව ඇණවුම් සහ නිෂ්පාදනයෙහි ඉහළ යෑමට අනුකූලව තොග මිලදී ගැනුම් ද වර්ධනය වූ නමුත්, සේවා නියුක්තිය පහළ ගියේය. ගෝලීය වෙළඳ පරිසරය තුළ ඉහළ ගිය අවිනිශ්චිතතාවයන්ට ප්‍රතිචාර වශයෙන් උපායමාර්ගික පියවරක් ලෙස, අත්‍යවශ්‍ය සේවක පුරප්පාඩු සඳහා පමණක් නැවත බඳවා ගැනීම් සිදු කිරීම සහ අවම අමුද්‍රව්‍ය තොග පවත්වා ගැනීම සිදු කරන බව ප්‍රතිචාර දැක්වූ බොහෝ අය සඳහන් කළහ. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙමු කාලපරිච්ඡේදය තුළ දී තවදුරටත් ඉහළ ගියේය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

**2025 ජූනි**

**51.9**

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | මැයි | ජූනි | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **55.5** | **51.9** | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නව ඇණවුම් | 56.5 | 50.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 55.5 | 52.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 56.0 | 49.0 | - | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| තොග මිලදී ගැනුම් | 50.0 | 50.5 | + | කඩඉම් මට්ටමේ සිට ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 56.7 | 58.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා නිෂ්පාදන කටයුතු සම්බන්ධ අපේක්ෂා ධනාත්මකව පවතී. කෙසේ වෙතත්, එක්සත් ජනපද වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධ අවිනිශ්චිතතා පිළිබඳව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් සිය අවධානය යොමුකර ඇත.

**ගෝලීය ප්‍රවණතා**
**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් පහත වැටීමක් |
| යුරෝපා කලාපය | අඩු වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2025 ජූලි 15 වන දිනට (PMI Releases (spglobal.com))*

[1] *එස් &පී ග්ලෝබල් (*S&P Global) *ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, සේවා ක්‍රියාකාරකම්වල වේගවත් වර්ධනයක් පෙන්නුම් කරමින් 2025 ජුනි මාසයේ දී දර්ශකාංක 61.9ක් වාර්තා කළේය.**

ව්‍යාපාර ක්‍රියාකාරකම් 2025 ජුනි මාසයේ දී ඉහළ යෑම සඳහා අංශ කිහිපයක සිදු වූ වර්ධනයන් හේතු විය. ඒ අනුව, ණය දීම් ඉහළ යෑම හේතුවෙන් මූල්‍ය සේවා හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව වර්ධනය විය. තවද, වෘත්තීය සේවා, රක්ෂණ, ප්‍රවාහන, වෙනත් පෞද්ගලික සේවා සහ දේපළ වෙළඳාම හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් ද ජුනි මාසය තුළ ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, ජුනි මාසය තුළ අනෙකුත් අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් බොහෝ දුරට නොවෙනස්ව පැවතුනි.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවාවන්හි සිදු වූ වර්ධනයත් සමඟ, 2025 ජුනි මාසයේ දී නව ව්‍යාපාරවල ඉහළ යෑමක් දක්නට ලැබුණි.


සමාගම් කිහිපයක සිදු වූ බඳවා ගැනීම් හේතුවෙන් සේවා නියුක්තිය 2025 ජුනි මාසයේ දී ඉහළ ගියේය. මේ අතර, නිම කිරීමට නියමිත කාර්යයන් පෙර මාසයට සාපේක්ෂව නොවෙනස්ව පැවතුනි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**61.9**

**2025 ජුනි**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | මැයි | ජුනි | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **57.0** | **61.9** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **නව ව්‍යාපාර** | 54.0 | 62.9 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **සේවා නියුක්තිය** | 44.0 | 51.6 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| **නිම කිරීමට නියමිත කාර්යයන්** | 45.0 | 50.0 | + | පහළ යෑමක සිට කඩඉම් මට්ටමට පැමිණීමක් |
| **අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම්** | 73.7 | 75.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා වූ අපේක්ෂාවන්, යහපත් සාර්ව ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ අඛණ්ඩව වර්ධනය විය. කෙසේ වෙතත්, නිර්වාසික තැනැත්තකු විසින් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සේවා සැපයීමේ දී එම සේවා සැපයීම්වලට අදාළව බදු ක්‍රියාත්මක කිරීම සහ එක්සත් ජනපද තීරුබදු හා මැද පෙරදිග කලාපයේ ඇති වූ ප්‍රවණතා සම්බන්ධ අවිනිශ්චිතතාවයන් සමහර සමාගම් විසින් ඉස්මතු කර ඇත.

**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| **ගෝලීය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **ඉන්දියාව** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **චීනය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **එක්සත් ජනපදය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **එක්සත් රාජධානිය** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **යුරෝපා කලාපය** | පහළ යෑමක සිට ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2025 ජූලි 15 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ භරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.